# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත

பிரதான செயலாளர் அலுவலகம் - தென் மாகாணம்

CHIEF SECRETARY'S OFFICE - SOUTHERN PROVINCE

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My Ref. | CSS/7/1/3 | ඔබේ අංකය<br>உனது இல<br>Your Ref. | | දිනය<br>திகதி<br>Date | 2020.07.24 |

**ප්‍රධාන ලේකම් චක්‍රලේඛ (මුදල්) 03/2016 (IV)**

දකුණු පළාත් සභාවේ
ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන් හා
ගණන් දීමේ නිලධාරීන්,

**ප්‍රසම්පාදන කමිටු සීමාවන් සංශෝධනය කිරීම.**

උක්ත කරුණ සම්බන්ධයෙන් නිකුත් කරන ලද ප්‍රසම්පාදන කමිටු සීමා පිළිබඳව 2016.08.24 දිනැති ප්‍රධාන ලේකම් චක්‍රලේඛ (මුදල්) 03/2016, 2016.12.27 දිනැති ප්‍රධාන ලේකම් චක්‍රලේඛ (මුදල්) 03/2016(I), 2018.11.14 දිනැති ප්‍රධාන ලේකම් චක්‍රලේඛ (මුදල්) 03/2016 (II) හා 2019.01.16 දිනැති ප්‍රධාන ලේකම් චක්‍රලේඛ (මුදල්) 03/2016 (III) ට අතිරේක වශයෙනි.

02. 2016.08.24 දිනැති ප්‍රධාන ලේකම් චක්‍රලේඛ (මුදල්) 03/2016 අනුව 422.1.(ඇ) සුළු වටිනාකම් සහිත අලුත්වැඩියා, වැඩ, භාණ්ඩ හා සේවා සෘජු මිළදී ගැනීම් (ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 3.5 හෝ 3.6) (ශ්‍රී ලංකා රජයේ අරමුදල් හෝ විදේශ අරමුදල් භාවිතා කරන) සීමා වගුවේ අංක 9 යටතේ, පළාත් අමාත්‍යාංශ ලේකම්/ ව්‍යාපෘති අධ්‍යක්ෂ බල අධිකාරියෙහි මෝටර් රථ සහ වෙනත් උපකරණ අලුත්වැඩියා කටයුතු වලදී රු.200,000/- ඉක්මවන අලුත්වැඩියාවන් සඳහා ප්‍රධාන ලේකම්ගේ පෞද්ගලික අනුමැතිය ලබා ගත යුතු බව දක්වා ඇත.

03. 2017.05.24 දින දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයේ දී දකුණු පළාත් ප්‍රධාන ලේකම්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වූ මාණ්ඩලික නිලධාරී සාකච්ඡාවේ දී මෙම වගන්තිය සංශෝධනය කරමින් වාහන අලුත්වැඩියා කිරීමේ මූල්‍ය සීමාව ඉවත් කර, එම වගකීම පළාත් අමාත්‍යාංශ ලේකම් වෙත පැවරීමට තීරණය කරන ලදි. ඒ අනුව මෝටර් රථ අලුත්වැඩියාවේදී තරඟකාරී ලංසු කැඳවීම පිරිමැසුම්දායී නොවන විට ප්‍රසම්පාදනයේ පිරිමැසුම්දායී බව පිළිබඳව පළාත් අමාත්‍යාංශ ලේකම් සහතික විය යුතු අතර පළාත් අමාත්‍යාංශ ලේකම් පෞද්ගලික අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක කල යුතුය. ඒ අනුව ඉදිරියේදී වාහන අලුත්වැඩියාව සඳහා පූර්ව එකඟතාවය ප්‍රධාන ලේකම් කාර්යාලයෙන් ලබා ගැනීම අවශ්‍ය නොවන අතර පළාත් අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය අනුව කටයුතු කල යුතු බව කාරුණිකව දන්වමි.

ආර්.සී. ද .සොයිසා,
ප්‍රධාන ලේකම්,
දකුණු පළාත.

පිටපත් - 01. සහකාර විගණකාධිපති, දකුණු පළාත - දැ.ගැ.ස
02. අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ, දකුණු පළාත - දැ.ගැ.ස
03. ගිණුම් හා ගෙවීම් අධ්‍යක්ෂ, දකුණු පළාත - දැ.ගැ.ස


| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| ප්‍රධාන ලේකම්<br>பிரதான செயலாளர்<br>Chief Secretary | 091 2232343 | කාර්යාලය<br>காரியாலயம்<br>Office | 091 2234052<br>091 2226118 | ෆැක්ස්<br>பெக்ஸ்<br>Fax | 091 2246299 | විද්‍යුත් තැපෑල<br>மின் அஞ்சல்<br>E-mail | chiefsec1@sltnet.lk | වෙබ් අඩවිය<br>இ தளம்<br>Web site | www.cs.sp.gov.lk |

ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල. Chief Secretary's Office, S.H. Dahanayaka Mawatha, Galle.
பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.


"විශිෂ්ටත්වයෙන් 1 ට එන යහපාලනයක්"